**ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යකරණය) - 2022**

---

ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (අතිරේක මූල්‍යකරණය) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර එළඹි 2021 සැප්තැම්බර් 04 දිනැති අංක 9255 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 2 වන උපලේඛනයේ I (බී) වගන්තිය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 07 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ කාලසීමාව

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන අමාත්‍යාංශය සහ වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තෝරාගත් දිස්ත්‍රික්කවල නල ජල සේවා සහ වැඩිදියුණු කළ සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩිකිරීම, ඒ ආශ්‍රිත ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම සහ සුදුසුකම් සහිත අර්බුදයකදී ක්ෂණිකව හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. අතිරේක මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,823 කට සමාන එ.ජ.ඩො මිලියන 42.74 ක් වූ අතර ඉන් රු.මිලියන 12,000 කට සමාන එ.ජ.ඩො මිලියන 40 ක් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව (අයිබීආර්ඩී) විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය.

අතිරේක මූල්‍ය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය 2021 සැප්තැම්බර් 04 දින එහි කටයුතු ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

### 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ වගුව 2.1 හි දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ දී ලබා දුන් ණය සඳහා පොලී වශයෙන් දරන ලද එ.ජ.ඩො 24,588.59 කට සමාන එකතුව රු. මිලියන 8.81 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ දී ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. එබැවින්, කෙරීගෙන යන වැඩ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 8.81 | මෙම ප්‍රතිපත්තිය 2018 වර්ෂයේ සිට භාණ්ඩාගාරය විසින් අත්හිටුවා ඇති අතර එය භාණ්ඩාගාරය විසින් රජයේ වියදම් ලෙස හඳුනාගෙන ඇති බැවින් අපගේ භාණ්ඩාගාර වැය විෂය වාර්තාවල ද එය නොපෙන්වයි. | ව්‍යාපෘති කාලය තුළ දරන ලද ණය ගැනීමේ පිරිවැය රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 230/2013 අනුව ප්‍රාග්ධනීකරණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ දී ලබා දුන් ණය සඳහා බැඳීම් ගාස්තුව වශයෙන් දරන ලද එ.ජ.ඩො 74,435.05 කට සමාන එකතුව රු. මිලියන 22.3 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ දී ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. එබැවින්, කෙරීගෙන යන වැඩ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 22.3 | එය අපගේ වැය විෂය වාර්තාවල නොපෙන්වන බැවින් එයද පෙර සඳහන් අඩුපාඩුව මෙන් ව්‍යාපෘති වියදමක් ලෙස හඳුනාගෙන නොමැත. | ව්‍යාපෘති කාලය තුළ දරන ලද ණය ගැනීමේ පිරිවැය රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 230/2013 අනුව ප්‍රාග්ධනීකරණය කළ යුතුය. |
| (ඇ) | රු. මිලියන 16.31 ක් වූ විනිමය අනුපාත වෙනස ඉදිරිපස අවසන් ගාස්තුවට අදාළව ගිණුම් පොත්වල ගලපා නොතිබුණි. එබැවින්, ණය ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 16.31 | මහ බැංකුවට ලැබුණු දිනට විනිමය අනුපාතිකය අනුව අපි ගිණුම් ගත කර ඇති අතර මාසික සාමාන්‍ය විනිමය අනුපාතිකය අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ගිණුම් ගත කරයි. නමුත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය, එල්කේඒඑස් 21 ට අනුව, 2022 දෙසැම්බර් 31 දින හඳුනාගත් ණය සඳහා සාමාන්‍ය විනිමය අනුපාත ගැලපීම වවුචර් අංක 5 මඟින් සිදු කර ඇත. | විනිමය අනුපාත වෙනස සමාලෝචිත වර්ෂය අවසානයේදී නිවැරදිව ගැලපිය යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘති කටයුතුවල භෞතික ප්‍රගතිය**

ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාකාරකම් 14 ක් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ක්‍රියාකාරකම් 06 කින් සියයට 50 සිට සියයට 85 ක් දක්වා වූ භෞතික ප්‍රගතියක් අපේක්ෂා කළ අතර සියයට 10 සිට 51 දක්වා වූ ප්‍රගතියක් පමණක් පිළිබිඹු විය. තවද, සමාලෝචිත වර්ෂය තුළ එක් ක්‍රියාකාරකමකින් සියයට 40 ක ප්‍රගතියක් සහ ක්‍රියාකාරකම් 7 කින් සියයට 25 ක ප්‍රගතියක් ලබා ගැනීමට සැලසුම් කර තිබූ ඉතිරි ක්‍රියාකාරකම් 8 හි ශුන්‍ය ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. බාහිර පාරිසරික බලපෑම් සහ ප්‍රසම්පාදන ප්‍රමාදය මෙම ප්‍රමාදයට හේතු වූ බව කළමනාකාරීත්වය සඳහන් කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාල සීමාව වන මාස 27 න් 2022 දෙසැම්බර් 31 දිනට මාස 15 ක් ගත වී ඇත. එබැවින්, ඉහත හඳුනාගත් ගැටළු මඟහරවා ගැනීම සඳහා කළමනාකාරිත්වය විසින් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නොගතහොත් සහ මෙම ව්‍යාපෘතිය පිළිබඳව සමීප අධීක්ෂණයක් තබා නොගතහොත් නියමිත කාල සීමාව තුළ ව්‍යාපෘතිය නිම නොකිරීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

## 3.2 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල ව්‍යාපෘතියේ සියලුම කාර්ය මණ්ඩලවල වැටුප් වත්මන් මූල්‍ය ගිවිසුමෙන් වියදම් කර තිබුණද, 2022 ඔක්තෝම්බර් මාසයේ වැටුප් සඳහා අතිරේක මූල්‍ය වැඩපිළිවෙළින් රු. මිලියන 13.9 ක මුදලක් වැය කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ අතිරේක මූල්‍ය ව්‍යාපෘතියේ නියැලී සිටි කාර්ය මණ්ඩලයේ පිරිවැය හඳුනා ගැනීමට අතිරේක මූල්‍ය භාවිතය සඳහා අවශ්‍ය මිනිස් බල අවශ්‍යතාවය සැලසුම් කර නොතිබුණි. | වැටුප ව්‍යාපෘති කළමනාකරණ පිරිවැයක් වන බැවින් සහ එය අරමුදල් දෙකෙහිම "ව්‍යාපෘති කළමනාකරණ සහාය" යන 4 වැනි සංරචකය යටතේ වැටෙන බැවින්, ව්‍යාපෘති කාර්ය මණ්ඩලය අරමුදල් දෙකම සඳහා නියැලී සිටින නිසා අපි මාස 1 ක වැටුප් ගෙවීම සඳහා අතිරේක මූල්‍යනය භාවිතා කර ඇත. | අතිරේක මූල්‍යකරණය යටතේ ව්‍යාපෘතිය සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතාවය ස්ථාපිත කළ යුතුය. |